
මුහුදු
යාළුවෝ
සෞභාග්‍යා

# මුහුදු යාළුවෝ

සෞභාග්‍යා සෙව්මිණි තෙන්නකෝන්

## කෘතියේ නම

මුහුදු යාළුවෝ

## කතෘගේ නම

ටී.එම්. එස්. සෙව්මිණි තෙන්නකෝන්

## කතෘ අයිතිය ඇතුලු විස්තර

කතෘ ප්‍රකිශනයකි

## කතෘගේ වෙනත් කෘති

---

## කෘතිය පල කරන දිනය

2024 වර්ෂය

# <u>පිදුම</u>

මාගේ ජීවන ගමනේ පහන් ටැඹක් මෙන්
ආලෝකය දෙමින් නිරතුරුවම මා අසල සිටින
ආදරණීය දෙමව්පියෝ දෙන්නාටත්, ආදරණීය
අයියාටත්, මේතාක් මා ලද අධ්‍යාපනයට
ශක්තියක් වුන ආදරණීය ගුරු මැණීවරුන්ටත්,
ඉතා ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක්

ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදූහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදූහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# මුහුදු යාළුවෝ

එක දවසක් මුහුදේ පීන, පීන හිටිය යාළු මාළුවෝ දෙන්නෙක්ට ලස්සන දිය කිඳුරියක් මුණගැසුනා. ඒ දිය කිඳුරිය මාළුවො දෙන්නාට කතාකරලා මෙහෙම ඇහුවා. ඔය දෙන්නාගේ නම් මොනවාද?. ඒ දෙන්නා ම එතකොට කිව්වා මම ටිනී, මෙයා විනී කියලා. එතකොට ඔයාගේ නම ? “මගේ නම ඒරියල්”. ඒක හරි ලස්සන නමක්. ස්තූතියි ඔයාට. ටික කාලයක් යනකොට මේ කට්ටිය හොඳ යාළුවෝ වුණා.



එක දවසක් මේ කට්ටිය චාරිකාවක් යන්න සූදානම් වුණා. ඒ තමයි මීට වසර ගණනාවකට පෙර මුහුදුබත් උණ ටයිටැනික් නැව බලන්නට යාමටයි. එහිදී අපි ටයිටැනික් නැව හොදින් නිරීක්ෂණය කළා. ඒ අතරතුර අපේ විනී නැව ඇතුලේ අතරමං වෙලා. අපි එයාව නැවේ හැමතැනම හෙවුවා. එතකොට එයා අපිට කාමරයක දී හමුවුණා. එතෙනදී විශ්මිත මුහුදු යාළුවෙක් අපට මුනගැසුණා. විනී ඒයා දිහා බලාගෙන හිටියා. ඒතමයි ඉතාමත් දීප්තිමත් අලෝකයක් විහිදුවන ලස්සන මුතු බෙල්ලෙක්. ඒරියල් ඒ මුතු බෙල්ලට කතා කළා. ඔයා කොහොමද මෙතෙනට ආවේ?. මම මෙතනට ආවේ මුහුදේ පාවෙලා. ඔයාට මෙතෙන ආරක්ෂිතද? "ඔව්" මිනිසුන් මගේ වගර්යාව අල්ලාගෙන ගොස් මරලා අපේ මුතු අරගන්නවානේ. ඒත් මාව මරන්න වෙන්නේ නැහැ. මම මෙතන ගොඩක් ආරක්ෂිතයි. "ඔයා අපේ සම්පතක්" ඒරියල් කීව්වා. මාව අගය කරනවාට ඔයාට ගොඩාක් ස්තූතියි. ඒක සුළු දෙයක්. අපි එහෙනම් යන්නම්. ඔයා

පරිස්සමින් ඉන්න. අපි තිදෙනා මුතු බෙල්ලාට සමු දී නැවත දිරාපත් වී ගිය නැවේ කොටස් නරඹා එම ස්ථානයෙන් පිටත්වී යාමට සූදානම් වුණා. එක්වරම ඒරියල් මහ හයියෙන් කෑගැසුවා. ටිනී සහ විනී එතනට පැමිණ ඇයිද බැලුවා. එතකොට ඔවුන් ඉදිරියේ විශාල මෝරෙක් සිටිනවා දුටුවා. ඔවුන් තම පණ බේරාගැනීමට එතනින් වේගයෙන් පීනා ගියා. ඒ අතරතුර ඒරියල් ගල් මල්වලට හසුවී ඇයගේ වරල හොඳටම තුවාල වුණා. ටිනී සහ විනී ඇවිත් ඒරියල්ව බේරා ගත්තා. ඉන්පසු ඔවුන් තම නිවහනට ගොස් ඒරියල්ට බෙහෙත් දැමීමට කටයුතු කළා.



අද ගමන හරිම අපුරුයි නේද?. ටිනී කිව්වා. "අපූරුයි තමයි" අද වෙච්ච කරදර ගොඩ විනී කිව්වා. අනේ විනී මගේ වරල ගොඩාක් රිදෙනවා. ඉන්න ඒරියල් මම ඔයාට කෑම හොයන් එන්නම්. හා විනී, මම ඒරියල්ව බලාගන්නම් ටිනී කිව්වා . ටිනී ඔයා පොඩ්ඩක් මෙහෙට එන්නකො. ඉන්න මම එනවා. ටිනී කිව්වා. ටිනී අපි අපිට පුළුවන් වෙලාවක මුතු බෙල්ලා බැලීමට යමුද? හා.... ඒත් එයා ඉන්න නැව ගොඩාක් දුරයිනෙ. ටිනී කිව්වා. "ඉදල හිටල හරි ගිහින් එමුකො" ඉස්සේලාම ඔයා සනීප වෙලා ඉන්නකෝ. විනී කෑම අරගෙන ආවා. අපි දැන් කෑම කමු. මේ තිදෙනා කෑම කන ගමන් ඒරියල් විනී ගෙනුත් ඇහුවා අපි මුතු බෙල්ලා බලන්න යමුද කියලා. හා, හා අපි යමු, විනී හරිම සතුටින් පැවසුවා. ඉන් අනතුරුව සතියකට පමන පසු මුතු බෙල්ලා බැලීමට යාමට තිදෙනාම තීරණය කළා. ඉතින් මේ කට්ටිය මුතු බෙල්ලා බැලීමට යනකොට විනී හා ටිනී ඒරියල්ට පිටිපස්සෙන් තමයි ගමන් කලේ. මේ අතරතුර ටිනී විනීට මෙහෙම

කිවුවා. ඊලග සතියේ ඒරියල්ගේ උපන් දිනය නේද? ඔව් ,ඔව් . අපි ඒරියල්ව පුදුම කරවන දෙයක් කරමු. හොද උත්සවයක් සංවිධානය කරන්නත් වේවි නේද?. ටිනී ඇසුවා. එතකොටම ඒරියල් ටිනීටයි, විනීටයි කතාකරලා මෙහෙම කීව්වා. "මොකද අද ඔය දෙන්නා පිටිපස්සෙන් එන්නේ'. වෙනදා ඔය දෙන්නා එන්නේ මම ළගණෙ. ඇයි අද ඔයාලට මොකක් හරි ප්‍රශ්නයක්ද?. නැහැ, නැහැ එහෙම එකක් නැහැ. එහෙනම් ඔතන ඉන්නෙ මෙහෙට එන්න ඒරියල් කිවුවා. හා, හා අපි එන්නම් දෙදෙනාම කිව්වා. ආ.... අපි කාතාවෙන්, කතාවට මුතු බෙල්ලා ලගටම ඇවිත්නේ. තිදෙනාම පුදුම උනා. ඒරියල් මුතු බෙල්ලාගෙන් මෙහෙම ඇහුවා. මුතු බෙල්ලෝ මට ඔයාගෙන් අහන්න ප්‍රශ්නයක් තියෙනවා. මොකක්ද ඔයාගෙ ප්‍රශ්නය මුතු බෙල්ලා ඇහුවා. ඔයා එදා කිවුවා නේද මෙතන ආරක්ෂිතයි කියල. ඔව්, ඔව් ඒත් ඉතින් මින්ස්සු මෙතන නරඹන්න එක එක මුහුදු යාත්‍රා අරගෙන එනවානෙ. එතකොට මිනිසුන්

ඔයාව අරන් යන්න හදන්නේ නැද්ද?. ඒරියල් ඇසුවා. නැහැ එහෙම වෙන්නේ නැහැ. පසුගිය කාලයේ මිනිසුන් පිරිසක් මෙම නෞකාව නැරඹීමට පැමිණ එම පැමිණි යාත්‍රාව පුපුරා සියළුදෙනාම විනාශවිය. එදින සිට මිනිසුන්ගේ පැමිණීම ක්‍රමක් ක්‍රමයෙන් අඩුවිය. එසේනම් මුතු බෙල්ලෝ ඔයා පරිස්සමින් ඉන්න. අපි ඔයාට සුභ ආරංචියක් රැගෙන නැවත දිනයක හමුවෙන්නම්. තිදෙනාම මුතු බෙල්ලාට සමුදී ආපසු තමන්ගේ මුහුදු පරිසරය සොයා ගමන් ආරම්භ කළාය.



තිදෙනාම මග යන අතරතුරදී ඒරියල් ඇහුවා ඔය දෙන්නා මුතු බෙල්ලා බැලීමට යන අතරතුර මට පිටිපස්සෙන් එන ගමන් මොනවද කතා කලේ කියලා?. ටිනී සහ විනී එකවරම පුදුමයට පත්වී මුහුනෙන් මුහුන බලාගත්තා. ඇයි මොකද එකපාරටම දෙන්නාට උනේ. ඒරියල් ඇහුවා. නැහැ අපි ඇත්ත කියන්නම් . අපි ඔයාගේ උපන්දිනය ගැනයි කතාකළේ. ටිනී කිව්වා. එතකොටම ඒරියල් කැස්බෑවෙක් ගේ ශරීරයේ ධීවරයින් විසින් බාවිතා කරන දැලක් පැටලී තියෙනවා දැක්කා. ඇය විසින් එම සිදුවීමත් සමගම මෙසේ පැවසීය. අපි මගේ උපන් දිනයට වෙනස් ම සියලුදෙනාටම ආදශර්මත් දෙයක් කිරීමට සැලසුම් කරමු. තිදෙනාම එයට එකග විය. ඒ අනුව අපි විසින් සාගර පතුල පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් සිදුකරීමට සැලසුම් කෙරුවෙමු. මුහුදේ තියෙන නොදිරන දේවල් අපි නිසිපරිදි බැහැර කරමු. ඒ මොනවගේ දේවල් ද?. විනී ඇසුවා. ඒ තමයි ෂොපින් , ප්ලාස්ටික්, ජල බෝතල්, ලන්ච් සීට්, සහ දැල්

ආම්පන්න වැනි දේවල් තමයි. අපට මෙහෙම කරන්නත් පුලුවන්. අපි තව මුහුදු යාළුවන්වත් මේ සඳහා එකතු කරගෙන සංවිධානයක් හදමු. එතකොට අපිට මේ සාගර පතුල ඉක්මනින් පිරිසිදුව ලස්සන කරගන්න පුළලුවන් වේවි නේද?. ඔව්, අපි එහෙම කරමු. ටිනී සහ විනී එකපයින්ම කැමති උනා. හරි එහෙනම් මගේ උපන් දිනය යෙදෙන දිනයට මුහුදු යාළුවන් සියළුදෙනාටම ආදශර්යක් ලබාදෙමින් අප තිදෙනා විසින් ප්‍රථමයෙන් මුහුදු පතුල පිරිසිදු කිරීම ආරම්භ කරමු. පසුව අපට අනෙක් මුහුදු යාළුවන්ගෙන් ලැබෙන ප්‍රතිචාර අනුව ඒ අයත් එකතු කරගෙන මෙම සාගර පතුල පිරිසිදු කිරීමේ ක්‍රියාන්විතය දිගටම සිදුකරගෙන යන්න පුළුවන් යැයි තිදෙනාම එකගතාවයකට පැමිණියේය.

ඒරියල් ගේ උපන් දිනය යෙදෙන දිනය උදාවිය. තිදෙනාම ඉතාම උනන්දුවෙන් යෝජනා කර ගත් පරිදි ශ්‍රමදානය සඳහා සූදානම් විය. මුහුදු පතුලට ඉර එලිය වැටෙනවාත් සමගම මුහුදු ජීවීන් වැඩිපුර

ගැවසෙන ගල් මල් පිරුණු ප්‍රදේශයකින් ශ්‍රමදානය ආරම්භ විය. තිදෙනාම ඉතා යුහුසුළුව මුහුදු පතුලේ ඇති පොලිතීන්, ප්ලාස්ටික්, ලන්ච් ෂීට සහ නොදිරන දැල් ආම්පන්න වැනි කොටස් එකතු කර එක් ස්ථානයකට ගොඩ ගැසීම ආරම්භ කරන ලදී. මෙය දුටු කැස්බෑවන්, මුහුදු සිංහයන්, තල්මසුන්, මෝරුන් මෙන්ම ඩොල්ෆින් වැනි විශාල මුහුදු යාළුවන් පිරිසක් ශ්‍රමදානය සඳහා සහයෝගය දක්වන ලදී. අප තිදෙනාට මාරම සතුටුයි. ටිනී සහ විනී දිය බුබුලු දමමින් ඒ මේ අත පිහිනමින් සතුට ප්‍රකාශ කරන්නට විය. ශ්‍රමදානය සඳහා පැමිණි මුහුදු යාළුවන් ඒරියල්ට මෙන්ම ටිනී සහ විනීට ස්තූතිය පුදකල අතර, ඔබලා තිදෙනා විසින් අද දින ආරම්භ කරණ ලද මෙම මහගු කාර්ය අපි සියලුදෙනාගේ දායකත්වය ඇතිව ඉදිරියට කරගෙන යාමට තල්මස් යාළුවන් විසින් යෝජනාවක් ගෙන එන ලදී. තවදුරටත් අදහස් දක්වමින් ඔවුන් පැවසුවේ මිනිසුන් විසින් ඉතාමත් අවිදිමත් ලෙස සමුද්‍රයට එකතු කරණ

මෙම නොදිරණ ද්‍රව්‍ය හේතුවෙන් අප මුහුදු ජීවීන් හට සිදුවන නොයෙකුත් හිරිහැර බාධක සහ ජීවිත අවදානම් මගහරවා ගැනීමට අපට මෙවැනිදේ සිදුකිරීමට ලැබීම ගැන සාගරයේ උරුමකරුවන් වන අපට මහත් කණගාටුදායක තත්වයක් බවය.



එබැවින්, අප මුහුදු යාළුවන් විසින් ආරම්භ කරණ ලද මෙම ක්‍රියාව හේතුවෙන් සියලු මිනිස් වර්ගයා මේ පිළිබද දැනුවත් වී කටයුතු කලහොත් අනාගත පරපුර වෙත සුන්දර සාගර පතුලක් මෙන්ම නීරෝගිමත් සහ නිදහස් මුහුදු

යාළුවන් පිරිසක් ඉතිරිවනු ඇතැයි අප විශ්වාස කරමු.

“ සියළු ජීවීන් ගේ ජීවත්වීමේ අයිතිය සුරැකීම මිනිසාගේ පරම යුතුකමක් බව” අප සිහිතබා ගනිමු.

## පසු වදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන්

දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-271-4